## ප්‍රසිද්ධ රඟ දැක්වීම් හා සැණකෙළි පැවැත්වීම සඳහා බලපත්‍ර නිකුත්කිරීමේ ක්‍රියාවලිය

ප්‍රසිද්ධ රඟ දැක්වීම් සහ සංදර්ශන ආඥා පනත යටතේ වන බලපත්‍ර ගාස්තු අය කිරීමට අදාළ යෝජනාව සම්මත කිරීම

↓

එළඹෙන වර්ෂයේ බලපත්‍ර ගාස්තු පැනවීමට අදාළ නිවේදනය ඊට පෙර වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ප්‍රථම ගැසට් පත්‍රයේ පළ කිරීම

↓

ඉල්ලුම්පත්‍රය ලබා ගැනීම

↓

නිවැරදිව සම්පූර්ණ කළ අයදුම් පත්‍රය භාර දීම

↓

තාක්ෂණ නිලධාරි නිර්දේශය

↓

රඟ දැක්වීම හා / හෝ සැණකෙළිය ගාස්තු අයකර පවත්වන්නේ නම් විනෝද බදු අය කිරීම

↓

බලපත්‍රය ලබා දීම අනුමත කිරීම

↓

බලපත්‍රය නිකුත් කිරීම

## 18.1 හැඳින්වීම

(අ) කිසියම් ස්ථානයක සිදු කරනු ලබන ප්‍රසිද්ධ රඟ දැක්වීමක් මඟින් යම් ආගමික හෝ සංස්කෘතික හෝ කිසියම් ජන වර්ගයක පැවැත්මට ඇති විය හැකි හානි හෝ පීඩා වැළැක්වීම සහතික කිරීම සඳහා යම් ප්‍රසිද්ධ රඟ දැක්වීමක් මහජනයා ඉදිරියේ ප්‍රදර්ශනය කිරීම සඳහා සහතික කිරීමේ බලධාරියා (රාජ්‍ය ආරක්ෂාව පිළිබඳ විෂය භාර අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන තැනැත්තා හෝ තැනැත්තන් සහතික කිරීමේ බලධාරියා වේ.) වෙත ඉදිරිපත් කර සහතික කිරීම මඟින් ප්‍රසිද්ධ රඟ දැක්වීම පාලනය කරනු ලැබේ.

(ආ) කිසියම් ප්‍රසිද්ධ රඟ දැක්වීමක් හෝ සැණකෙළියක් පැවැත්වෙන ස්ථානයකට රැස්වන මහජනතාවගේ සෞඛ්‍ය හා සනීපාරක්ෂාව, පහසුව සහ ආරක්ෂාව පිළිබඳ පූර්ව ප්‍රතිකර්ම පවත්වාගෙන යනු ලබන බවට සහතික වීමෙන් අනතුරුව, ඒ යම් රඟ දැක්වීමක් හෝ සැණකෙළියක් පැවැත්වීම සඳහා පළාත් පාලන ආයතනය විසින් නිකුත් කරනු ලබන සහතිකය “බලපත්‍රය” වශයෙන් හඳුන්වනු ලැබේ.

## 18.2 නෛතික අධිකාරිය

176 වන අධිකාරය වූ ප්‍රසිද්ධ රඟ දැක්වීම් හා සැණකෙළි පිළිබඳ ආඥා පනත.

## 18.3 සුදුසුකම්

176 වන අධිකාරය වූ ප්‍රසිද්ධ රඟදැක්වීම් හා සැණකෙළි පිළිබඳ ආඥා පනතේ 2 වන වගන්තියේ අර්ථ නිරූපණය කර ඇති සැණකෙළියක් පැවැත්වීමට අදහස් කරනු ලබන යම් තැනැත්තකු මේ සඳහා සුදුසුකම් ලබයි.

## 18.4 ගාස්තුව

ප්‍රාදේශීය සභාව විසින් කලින් කල තීරණය කරනු ලබන ආකාරයේ බලපත්‍රගාස්තුවක් ගෙවිය යුතුය.

## 18.5 ඉදිරිපත් කළ යුතු ලේඛන

නිසි බලධාරියා (පළාත් පාලන ආයතනය) සෑහීමට පත් වන ආකාරයෙන් පහත සඳහන් අවශ්‍යතා සම්පූර්ණ කර ඇති බව තහවුරු කරමින් මෙහි ඇමුණුමෙහි දැක්වෙන ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කළ යුතුය.

(අ) ඒ ස්ථානයට රැස්වන මහජනතාවට ප්‍රමාණවත් වැසිකිළි පහසුකම් (ස්ත්‍රී, පුරුෂ සහ ආබාධිත අයට වෙන වෙනම) සපයනු ලබන බව;

(ආ) ඒ ස්ථානයේ ඉදි කර ඇති තාවකාලික ගොඩනැගිලි ප්‍රමාණවත් සවි ශක්තියකින් යුක්ත වන බව;

(ඇ) එහි රැස් වී සිටින මහජනතාවට දූෂණයට ලක් නොවූ හා ප්‍රමාණවත් වාතාශ්‍රයක් පවතින බව;

(ඈ) හදිසි ගිනි ගැනීමක දී යොදා ගත හැකි පරිදි ප්‍රමාණවත් ගිනි නිවීම් උපකරණ (සාමාන්‍ය ගිනි නිවීම්, විදුලි ගිනි නිවීම් සහ ඉන්ධන ගිනි නිවීම් උපකරණ) යොදා ගනු ලබන බව;

(ඉ) ආපදා අවස්ථාවක දී, රැස් වී සිටින ජනතාව ඉතා කෙටි කාලයක් ඇතුළත ඉන් ඉවත් කිරීමට ප්‍රමාණවත් පිටවීමේ දොරටු සහ ආරක්ෂිත වැඩ පිළිවෙළ යොදා ඇති බව.

(ඊ) සැණකෙළි භූමිය තුළ සාමය පවත්වාගෙන යාමට අවශ්‍ය වැඩ පිළිවෙළ යොදා ඇති බවට ප්‍රදේශයේ පොලිස් ස්ථානාධිපති විසින් නිකුත් කරන ලද සහතිකයක් ඉදිරිපත් කළ යුතුය.

සටහන:1. සැණකෙළි භූමිය සකස් කිරීමෙන් පසුව සහ සැණකෙළිය පැවැත්වීමට පෙර ඉල්ලුම් පත්‍රය ප්‍රාදේශීය සභාවට ඉදිරිපත් කළ යුතුය.

2. 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තියෙන් ප්‍රාදේශීය සභාවට නියම වී ඇති කර්තව්‍යය තහවුරු කළ හැකි වන පරිදි, ඉහත කරුණු සම්පූර්ණ කර නොමැති යම් සැණකෙළියක් සඳහා බලපත්‍රයක් නිකුත් කිරීම ප්‍රතික්ෂේප කිරීමට ප්‍රාදේශීය සභාවට බලය ඇත.

3. සැණකෙළිය ආරම්භ වන දිනයට දින 7 කට පෙර ඉල්ලුම් පත්‍රය ප්‍රාදේශීය සභාවට ඉදිරිපත් කිරීම ඉල්ලුම්කරුගේ වගකීම විය යුතුය.

## 18.6 කාර්යය පටිපාටිය

| අනු අංකය | පටිපාටිය | කාල සීමාව | අධිකාරය |
|---|---|---|---|
| 1 | නිවැරදිව සම්පූර්ණ කරන ලද ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කිරීම | | |
| 2 | භාර ගත් ඉල්ලුම් පත්‍රය තාක්ෂණ නිලධාරි වෙත යොමු කිරීම | ඉල්ලුම් පත්‍රය භාර ගත් දින | පෙරටු කාර්යාල නිලධාරි / විෂය භාර නිලධාරි |
| 3 | ඉල්ලුම් පත්‍රයේ දැක්වෙන කරුණු සහ සැණකෙළිය පැවැත්වීමට යෝජිත භූමියේ හා ගොඩනැගිලි, වැසිකිළි හා කැසිකිළි තත්ත්වය පරීක්ෂා කර නිරීක්ෂණ හා නිර්දේශ ඉදිරිපත් කිරීම | ඉල්ලුම් පත්‍රය භාර ගත් දින සිට දින 3 ක් ගත වීමට පෙර | මහජන සෞඛ්‍ය පරීක්ෂක / තාක්ෂණ නිලධාරි |
| 4 | බලපත්‍රය නිකුත් කිරීම සඳහා නිර්දේශ කර ඇත්නම්, විනෝද බදු ගෙවීම සඳහා ප්‍රවේශ පත්‍ර සමඟ ඉල්ලීම කරන ලෙස දැන්වීම | ඉල්ලුම් පත්‍රය භාර ගත් දින සිට දින 5 ක් ගත වීමට පෙර | පෙරටු කාර්යාල නිලධාරි / විෂය භාර නිලධාරි |
| 5 | විනෝද බදු කාර්යය පටිපාටිය අනුගමනය කිරීම සඳහා ආදායම් අංශය දැනුම්වත් කිරීම | | පෙරටු කාර්යාල නිලධාරි / විෂය භාර නිලධාරි |
| 6 | බලපත්‍රය නිකුත් කිරීමට / ඉල්ලීම ප්‍රතික්ෂේප කිරීමට අනුමතය දීම | විනෝද බදු මුදල් ගෙවූ දින / තාක්ෂණ නිලධාරි ගේ නිර්දේශ ලැබුණු දින සිට දින | සභාපති / ලේකම් |
| 7 | ගාස්තු අය කර ගෙන බලපත්‍රය නිකුත් කිරීම / ඉල්ලීම ප්‍රතික්ෂේප කරන දැන්වීම අත්සන් කිරීම | විනෝද බදු මුදල් ගෙවූ දින / තාක්ෂණ නිලධාරි ගේ නිර්දේශ ලැබුණු දින සිට දින | සභාපති / ලේකම් |
| 8 | නිකුත් කළ බලපත්‍රයේ සඳහන් කොන්දේසි එලෙසම පවත්වා ගෙන යන බව තහවුරු කර ගැනීමට ස්ථානය පරීක්ෂා කිරීම. | සැණකෙළිය පවත්වන කාලය ඇතුළත දිනපතා | මහජන සෞඛ්‍ය පරීක්ෂක / ආදායම් පරීක්ෂක / තාක්ෂණ නිලධාරි |